# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
# 2013 ජනවාරි මස 22 වන දින පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01.** ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

**(ප්‍ර/V (1)13/01)**

අ. ත්‍රීරෝද රථ සඳහා මීටර් බෙදාදීමේ ව්‍යාපෘතිය බස්නාහිර පළාත් කර්මාන්ත අධිකාරිය සතු විෂයයක් නොවන බව ඔබතුමා පිළිගන්නේද ?

ආ. එය කර්මාන්ත අධිකාරියේ ප්‍රඥප්තියට පටහැනි බව ඔබතුමා පිළිගන්නේද ?

ඇ. නොඑසේනම්, ඒ මන්ද ?

ඈ. ත්‍රීරෝද රථ සඳහා මීටර් බෙදා දෙන්නේ නම් එයට අදාල අමාත්‍යාංශය වනුයේ ප්‍රවාහන අමාත්‍යාංශය බව පිළිගන්නේද?

ඉ. නොඑසේනම්, ඒ මන්ද ?

ඊ. ත්‍රීරෝද රථ ස්වයං රැකියාවක් බවත්, එසේම එය සේවා ගනයට අයත් විෂයයක් බවත් ඔබතුමා පිළිගන්නේද ?

උ. නොඑසේනම්, ඒ මන්ද ?

ඌ. ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේද ?

එ. නොඑසේනම්, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය ."

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු එම්.එම්.එම් අම්ජාඩ් මන්ත්‍රීතුමා :**

" අද පළාත් පාලන ආයතන සතු මාර්ගයන්හි විශාල සංවර්ධනයක් සිදු වෙමින් පවතී. " මහ නැඟුම ", " ගම නැඟුම ", " පළාත් නිශ්චිත සංවර්ධන " ආදී වශයෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධනයක් සිදුවේ.

නමුත්, අද පළාත් පාලන ආයතන, මාර්ග අලුත් වැඩියා හා නඩත්තු කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දීම අවම මට්ටමකට පත්වී ඇත. යම් යම් මාර්ග නඩත්තු කටයුතු සම්පූර්ණයෙන්ම නොසලකා හැරීම මත එම මාර්ගයන් ඛාදනයට ලක්ව දැඩි අබලන් තත්වයට පත්වී ඇති අවස්ථා අප විසින් දැක ඇත.

එම නිසා සෑම පළාත් පාලන ආයතනයකම මාර්ගයන්හි දෛනික නඩත්තු කටයුතු ඒකක ස්ථාපිත කර එම මාර්ග අවම මුදලක් වියදම් කර ආරක්ෂා කර ගැනීමටත් ඒ සඳහා අදාළ පළාත් පාලන ආයතනයන්හි කාර්යක්ෂමතාවය ඇගයීම් කිරීමටත් බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් අධීක්ෂණ ඒකකයක් ඇති කල යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

**(යෝ/v(01)12/15)**

## XI. පොදු කටයුතු

**01. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)**

***"බස්නාහිර පළාත් සභාවේ 2012 අංක ................ දරණ පෙර පාසැල් ප්‍රඥප්තිය"***

**(දෙවන වර කියවීම)**

ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියවීම
2012.09.18 දින සිදු කර ඇත.

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.01.10 දින
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.